# ලියෝ



අරුන්දි සෙනෙවිරත්න

කතා

# ලියෝ

## අරුන්දි සෙනෙවිරත්න

කතා

පළමු දිගහැරීම

මහාමායා බාලිකා විදුහල
5 ශ්‍රේණිය E
2025.02.08

ISBN 978-624-208-768-9

# පිදුම

මහාමායා බාලිකා විදුහලේ සියලුම
ගුරු මව්වරුන් සහ පියවරුන් වෙත පුදමි.

## පෙරවදන

සාහිත්‍යය රටක සංවර්ධනය මනින මිනුම් දන්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණිය යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුල පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරදන අත්ථදස්සි හිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණ ගත්කරණී"**ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම, එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි.

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# ලියෝ


එක ගෙදරක ලස්සන පූස් අම්මා කෙනෙක් හිටියා. ඒ පූස් අම්මට ලස්සන පූස් පැටව් පස් දෙනෙක් හිටියා. ඒ අය හරිම හුරතල් ඒ වගේම හරිම දඟයෝ.



ඔහොම ටික කාලයක් ගතවුනා. දැන් පූස් පැටව් පස්දෙනා ටිකක් ලොකුයි. ඒ හින්දා දවසක් පූස් අම්මා මෙහෙම කිව්වා " දැන් ඔයාලා ඉස්සරට වඩා ටිකක් ලොකුයිනේ දැන් ඉතින් කුරුමානම් අල්ලන්න, ගස්

නගින්න ගස් වලින් බිමට පනින්න පුරුදු වෙන්න වෙයි” පැටව් ටික වැඩේට එක පයින් කැමතිවුනා.

පූස් අම්මා පහුවදා උදෙන්ම පැටව් ටික කැලේට එක්කරගෙන ගියා. පූස් අම්මා ගහකට නැගලා පෙන්නුවා “ දැන් ඔයාලත් මම කරන විදියට කරන්න” පූස් අම්මා කිව්වා.



පළවෙනි පූස් පැටියා ගහට නැංගා. එයා වැඩේ හොඳට කළා. දෙවැනි පූස් පැටියත් වැඩේ හොඳට කළා. පූස් අම්මා ඒ දෙන්නට හොඳයි කිව්වා. ඒ දෙන්නා කළා වගේ අනික් පැටව්න්ටත් ගහට නගින්න කියලා පූස් අම්මා සන්තෝසෙන් බලාගෙන හිටියා.

අන්තිම පූස් පැටියත් ගහට නැංගා. එයා ගහ උඩ ඉඳලා බිම බැලුවා. එයාට ගොඩාක් බය හිතුනා. එයා කොයි තරම් බය උනාද කියනවනම්, එයා ගහ බදාගෙන ඤාව් ..... ඤාව් ..... කියාලා හොඳටම කෑ ගැසුවා.



පූස් අම්මා ගහ උඩට නැගලා පූස් පැටියව කටෙන් අල්ලගෙන පහළට ගෙනාවා. පූස් අම්මා එයාව තුරුල් කර ගත්තා. බය වෙන්න එපා කියලා පැටවුන්ට කිව්වා.

පූස් අම්මයි පූස් පැටව් පස් දෙනයි ඊලඟ වැඩේට ගියා. ඒ තමයි කුරුමානම් ඇල්ලීම. මේ අය කැලේ තවත් ඇතුලට ගියා. ගහක පහළ අත්තක කුරුල්ලෙක් වහලා ඉන්නවා පූස් අම්මා දැක්කා. " පැටව්නේ ඔයාලගේ කුරුමානම තමයි අන්න අර අත්තේ වහලා ඉන්න කුරුල්ලා" පූස් අම්මා කිව්වා.

පූස් අම්මා කුරුමානම අල්ලන හැටි පෙන්නුවා. පූස් අම්මා බිමට පාත්වෙලා නැට්ට එහාට මෙහාට වනනවා පූස් පැටව් ටික බලාගෙන හිටියා.

“අන්න කුරුල්ලා බිමට ආවා” පූස් අම්මා කිව්වා. පැටව් දෙන්නෙක් කුරුල්ලාගෙ දෙපැත්තෙන් හොරෙන් හොරෙන් ගියා. කුරුල්ලාට ටික ටික ලං කළා. කුරුල්ලා මේ බවක් දන්නේ නෑ. පූස් පැටව් දෙන්නම එක පාරටම කුරුල්ලා ඉන්න තැනට පැන්නා. කුරුල්ලා කළබලෙන් ඉගිලිලා ගියා. පූස් පැටව් දෙන්නගෙ ඔළු දෙක එකට හැප්පුනා. එක බලාගෙන හිටිය අනෙක් පැටව් ටිකට හොඳටම හිනා.



“හරි අදට ඇති දැන් හොඳටම හවස් වෙලානේ අපි ගෙදර යමු.” පූස් අම්මා කිව්වා. කට්ටියම ගෙදර යන්න පිටත් වුනා .

ඔය අතරේ එක පැටියෙක් පාර දිගේ සෙල්ලම් කරමින් එහා මෙහා දිව්වා. මේ පැටියට එක පාරටම ලස්සන සමනලයෙක් මුණගැසුනා. සමනලයා මලින් මලට ගොස් මල් පැණි බෙමින් පූස් පැටියත් දන්නෙම නැතුව සමනලායා පස්සෙන් ටිකක් ඈතට ගියා.



පස්ස හැරිලා බලනකොට අම්මයි අනෙක් පැටව් ටිකයි නෑ. පූස් පැටියා හොඳටම බයවුනා. එයා කෑ ගහන්න පටන් ගත්තා. එත් කව්රුවත් ආවේ නෑ. පූස් පැටියට හොඳටම දුක හිතුනා. එයා අඬන්න පටන් ගත්තා. අඬ අඬා එහාට මෙහාට ඇවිද්දා. පූස් පැටියට කැලෙන් එළියට එන්න පුළුවන් වුනා. හැබැයි පුරුදු නැති පැත්තකටයි එයා ඇවිත් තියෙන්නේ. පූස් පැටියා පාර දිගේ ඇවිදගෙන ගියා.




පාර දිගේ පුංචි ලස්සන පූස් පැටියෙක් ඇවිදගෙන යනවා, පාරේ සෙල්ලම් කරමින් සිටි සනුලියි එයාගේ අක්කයි දැක්කා. ඒ දෙන්නා පූස් පැටියා ලඟට ඇවිත් පූස් පැටියව වඩා ගත්තා.

“ අක්කේ අපි මේ පැටියව ගෙදර අරගෙන යමු.” සනුලි කිව්වා. අක්කත් ඒ අදහසට කැමති වුණා. සනුලියි අක්කයි පූස් පැටියවත් අරගෙන ගෙදර ගියා.



සනුලි පැටියට කිරි ටිකක් දුන්නා. හොඳම බඩගින්නේ හිටිය පූස් පැටියා එක හුස්මට කිරි ටික බිව්වා. සනුලියි අක්කයි පූස් පැටියට නිදාගන්න ලස්සන කූඩයක් හැදුවා. සනුලි පූස් පැටියව කූඩයෙන් තියලා පැටියට නින්ද යනතුරු ඔළුව අතගෑවා.

ඔය අතරේ පූස් අම්මා අනෙක් පැටව් ටිකත් එක්ක ගෙදර ගිහින්. ටික වෙලාවක් යනකොට පූස් අම්මා දැනගත්තා එක පැටියෙක් අඩුයි කියලා. පූස් අම්මා කලබල වුනා . ගේ හැමතැනම හෙව්වා. වත්ත පහළත් හෙව්වා. පාර දිගේත් හෙව්වා.  එත් හොයා ගන්න බැරි වුණා.  දැන්නම් හොඳටම කළුවරයි. පූස් අම්මා ආපසු හැරී ගෙදර ගියේ හරිම දුකින්.  පූස් අම්මා අනෙක් පැටව් ටිකත් තුරුළු කරගෙන නිදා ගත්තා.



පූස් අම්මා පහුවදා උදේම අවදිවුණා. ලස්සනට ඉර පායනවා. " ඔයාලා කොහෙවත් යන්නෙ නැතුව පරිස්සමින් ඉන්න. මම යනවා නැතිවුණ පැටියා හොයන්න" කියලා පූස් අම්මා පිටත්වුණා.

පූස් අම්මා කැලෑව පැත්තට ගියා , පාරවල් දිගේ ගියා, ගෙයක් ගෙයක් ගානේ ගිහින් පැටියව හෙව්වා. අවසානයේ පූස් අම්මා සනුලිලාගේ ගේ ලඟටත් ආවා.



එදා උදෙන්ම අවදිවුණු සනුලි පූස් පැටියව වඩාගෙන හුරතල් කරන්න පටන් ගත්තා. පූස් පැටියත් සනුලිට ආදරෙයි. සනුලිගේ අක්කත් පූස් පැටියට ආරෙයි. "අක්කේ අපි මේ පැටියට නමක් දාමු". සනුලි කිව්වා. "එක හොඳයි". අක්කත් කිව්වා. මේ පැටියා දුඹුරුයි සුදුයි ලස්සන පූස් පැටියෙක් හින්දා අපි  මේ පැටියට " ලියෝ " කියලා නම දාමු". සනුලි කිව්වා. අක්කත් ඒ නමට කැමති වුණා.



තුන්දෙනාම මිදුලේ හරි හරියට සෙල්ලම් කරනවා පූස් අම්මා දැක්කා. පූස් අම්මට හරි සතුටුයි. පූස් පැටියෙක් කවදා හරි මිනිස් ගෙදරකට යන්න ඔනනේ. පූස් අම්මා හිතුවා.  පැටියට හොඳ කරුණාවන්ත මිනිස්සු ඉන්න ගෙදරක් හම්බවෙලා තියෙන නිසා පූස් අම්මා හරිම සතුටින් ආපසු ගෙදර ගියා.

ලියෝ හරිම වාසනාවත්ත පූස් පැටියෙක්. සනුලියි එයාගෙ අක්කයි ලියෝව ආදරෙන් බලා ගත්තා, ලියෝත් හරිම සතුටින් කාලය ගත කළා. පූස් අම්මත් ඉදලා හිටලා ඇවිල්ලා ලියෝව බලලා යන්න අමතක කලේ නෑ.

නිමි.

# පසු වදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත්, අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත්, සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පසාල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත  ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත් තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.  පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් විමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක භාවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණිය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-768-9